# සුඛවිහාරී ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලොවට නැගු ප්‍රදීපයක් වැන්නාවු සර්වඥයන් වහන්සේ අනුපිය නම් නුවර ආශ්‍රය කොට අනුපිය නම් අඹ වනයෙහි වැඩවසන සේක් සුඛවිහාරී වූ බද්ධිය ස්ථවිරයන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාලසේක. සුඛවිහාරී වූ බද්ධිය ස්ථිවිරයන් වහන්සේ සත්‍රිය රාජකුමාරයන් සදෙනාගේ සමා සමයෙහි උපාලි ස්ථවිරයෙන් වහන්සේ සත්වැනි කොට පැවිදි වූ සේක. ඔහුන් අතුරින් බද්ධිය ස්ථිවිරයෙන් වහන්සේය, කිම්බිල ස්ථිවිරයන් වහන්සේය, භගු ස්ථවිරයන් වහන්සේය,දේවදත්ත ස්ථවිරයන් වහන්සේය. යන සතර දෙනා වහන්සේ රහත් වූ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ සෝවාන් වූ සේක.  අනුරුද්ධ ස්ථිවිරයන් වහන්සේ දිවැස් ලත් සේක. දෙව්දත් ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන ලාභි වූ සේක. සත්‍රිය රාජ කුමාරවරුන් සදෙනාගේ කථාව අනුපිය නුවර දක්වා බණ්ඩංගාල ජාතකයෙහි මතු ප්‍රකශ වන්නේය. ආයුශ් මත් වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ වනාහි රජවූ කල්හි තමන් රක්ෂා කරන සේක් රක්ෂාවට විධාන කිරීමද පළමු කොට බොහෝ ආරක්ෂාවෙන් රක්ෂා කරන ලදුව මතු මහල් තලයෙහි මහ යහන් හි ඔබිනොබ පෙරෙලෙමින් සයන කරන්නා වූ තම හට භය පැමිණීමද දූන් අරහත් ඵලයට පැමිණ ආරණ්‍යාදී වූ යම් කිසි තැනෙක් හි හැසිරෙණ සේක් තමාට පහ වූ බය ඇති බව දක්නා සේක් ඉතා සැපය ඉතා සැපයි කිය කියා ප්‍රිති වාක්‍ය පවත්වන සේක. ඒ අසා භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් වූ භද්දිය ස්ථවිරියන් වහන්සේ අභිතත්වය ප්‍රකාශ කරන සේකැයි කියා සර්වඥයන් වහන්සේට දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට වදාරන සේක් මහණෙනි භද්ධිය ස්ථිවිරයෝ සැප විහාරි වූවෝ දැන් මතු නොවෙති. පෙරත් සැප විහාරි වූ හයි වදාරා භික්ෂූන් විසින් ඒ කාරණය ප්‍රකාශ කරනු පිණිස යාඥ්ඥා කල කල්හි සර්වඥයන් වහන්සේ භවයෙන් වැසි තුබුනු ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණකල්හි අප මහා බෝධිසත්වයන්වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි ඉපද වැඩිවයසට පැමිණ වස්තුකාම කෙලශකාමයෙහි ආදීනවද මහභිනික්මන් න්ක්ම මෙහි ආනිසංසද දැක වස්තුකාම කෙලාශකාම හැර හිමාලවනයට වැද සෘෂි ප්‍රවජ්ජ්‍යාවෙන් පැවිදිව අෂ්ටසමාපත්ති උපදවා වාසය කරණසේක්, උන්වහන්සේට මහත් පිරිවර වූයේය. පන්සියයක් පමණ තපස්විහු වුවාහුය, අප මහාබෝසතානන් වහන්සේ වර්ෂා කාලයෙහි හිමාලයෙන් නික්ම තපස්වි සමූහයා විසින් පිරිවරණලදුව ගම්නියම්ගම් ආදීයෙහි සැරිසරා වඩනාසේක් බරණැස්නුවරට පැමිණ රජුහු නිසා රාජොද්‍යානයෙහි වාසයකළ සේක. එතැන්හි වැසි සාරමස වාසයකොට රජහට දැන්වූසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට කියනසේක් ස්වාමීන්වහන්ස නුඹවහන්සේ වෘද්ධසේක. හිමාලය වනයට යාමෙන් නුඹවහන්සේට කවරප්‍රයෝජනද අතවැස්සන් හිමාලය වනයට යවා මෙතැන්හිම වාසය කරව යි කීයේය. බෝධිසත්වයන් වහන්සේ ප්‍රධාන අතවැසි තපස්වීන්වහන්සේට පන්සියයක් තපස්වීවරුන් භාරකොට තෙපි යව මේ තපස්වීවරයන් හා සමග හිමාලයවනයෙහි එතැන්හිම වාසය කරව. බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රධාන අතවැසි තපස්වීන් වහන්සේ රාජතපස්වීන් වහන්සේය. මහත් රාජ්‍යයක් හැර පැවැදිව කිසුණු පිරියම් කොට අෂ්ටසමාපත්ති ලාභිව වසන සේක් සෙසු තපස්වීන් හාසමග හිමාලය වනයෙහි වසන සේක් එක් දවසක් ආචාරීන් වහන්සේ දක්නා කැමතිව ඒ තපස්වීවරයන්ට ආමන්ත්‍රණය කොට තෙපි උකටලී නොව මෙතැන්හිම වාසය කරව මම ආචාරීන් වහන්සේට නමස්කාරකොට එන්නෙමියි කියා ආචාරීන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට එන්නෙමි යි කියා ආචාරීන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට පිළිසඳර කථාකොට එක් මැඩිලිපතක් අතුට ආචාරීන් වහන්සේගේ සමීපයෙහිම උන්සේක එවෙලෙහි බරණැස් රජ්ජුරුවෝ තපස්වීන් වහන්සේ දකිම් කියා උයනට ගොස් නමස්කාරකොට එකත්පසසෙක්හි හුන්සේක. අතවැසි තපස්වීන් වහන්සේ රජ්ජුරුවන් දැකත් නොමනැගී සිටිසේක්ම හුන්සේක්ම වනාහි ඉතා සැපය ඉතා සැපයයි කියා ප්‍රීතිවාක්‍ය පැවැත්වූසේක. රජතෙම සිතනුයේ මේ තපස්වීන් වහන්සේ මා දැකත් නැගී නොසිටිසේකැයි අසන්තෝෂව බෝධිසත්වයන් වහන්සේට කීයනසේක් ස්වාමීන්වහන්ස, මේ තපස්වීන් වහන්සේ කැමතිපරිද්දෙන් ආහාරය අනුභව කළසේක්ද ප්‍රිති වාක්‍ය පවත්වනසේක් සැපසෙයාාවම කරණසේකැ යි කීයේය. මහරජ, මේ තපස්වීන් වහන්සේ දැන් මම පෙර ගිහිකල්හි රජ්‍යශ්‍රී අනුභවකරන්නෙමි ආයුධගත් අත් ඇති බොහෝ සේනාව විසින් රාක්‍ෂා කරණු ලබන්නේම් මෙබඳු සැපයක් නොලද්දෙමි කියා තමාගේ ප්‍රව්‍රජ්ජ්‍යාසැපය ධ්‍යාන සැපය අරභයා මේ ප්‍රිති වාක්‍ය පැවැත්වූයේයයි වදාළසේක. මෙසේද කියා බෝධිසත්වයන් වහන්සේ රජහට ධර්මදේශනා කොට වදාළසේක. යම් පුද්ගලයක්හු සෙසු බොහෝ පුද්ගලයෝ රක්ෂා නොකරෙද්ද යමෙක් සෙසු බොහෝ සත්ව යන් රක්ෂා නොකෙරේද මහරජ, ඒ පුද්ගලයා වස්තුකාම කේල්ශ කාමයෙහි අපේක්ෂාවක් නැතිව හුදකලාව කායවිවේක චිත්තවිවේක සැපයෙන් යුක්තව සයනය කරන්නේය හුදෙක් සයනය කරන්නේම නොවෙයි. මෙබඳු පුද්ගලතෙම සැපසේ යන්නේය සැපසේ සිටින්නේය. සැපසේ හිඳින්නේය සැපසේ හෝනේය සියලු ඊර්යාපථයෙහි සැපසේ කල්යවන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ ධර්මදේශනාව අසා තුටුපහටු සිත් ඇතිව නමස්කාර කොට වාසභවනයට ගිය සේක. අතවැසි තපස්වීන් වහන්සේද ආචාරීන් වහන්සේට වැඳ හිමාලය වනයට වැඩිසේක. බෝධිසත්වයන් වහන්සේ වනාහී එතැන්හිම වාසයකරණ සේක් නොපිරිපුන් ධ්‍යානයෙන් යුක්තව කාලක්‍රියා කොට බ්‍රහ්මලෝකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ දම්දෙසුන් ගෙණහැර දක්වා අතීත කථාව හා වර්ථමාන කථාව වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ සුඛවිහාරී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි අතවැසි තපස්වීන් වහන්සේ නම් දැන් භද්දිය ස්ථවිර වූ සේක. ශාස්තෘන් උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජුවූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.